ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
**මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය**
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

# ලංසු ආරාධනය

**ආගමන හා විගමන දෙපාර්තමේන්තුවවෙත UPS09ක් සැපයීමේ, බෙදීමේ, ස්ථාපිත කිරීමේ,බලය පැවරීමේ සහ නඩත්තු කිරීමේ ප්‍රසම්පාදනය**

**IFB අංකය:DIE/PRO/06/2025/19**

1. ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් **මහනුවර, මාතර, වව්නියාව, යාපනය ප්‍රාදේශීය කාර්යාල සහ ගාල්ල, හම්බන්තොට, කන්කසන්තුරේ, කොළඹ වරායන් සහ පලාලි ගුවන් තොටුපලවෙත 20KVAUPS 04ක්, 15KVA UPS 01ක් සහ 06KVAUPS 04ක්** සැපයීමේ, බෙදීමේ, ස්ථාපිත කිරීමේ, බලය පැවරීමේ සහ නඩත්තු කිරීමේ ප්‍රසම්පාදනයසඳහායෝග්‍යතා පූර්ණ සැපයුම්කරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

2. මෙම ලංසුකරණය ජාතික තරඟකාරී ලංසුකරණ ක්‍රියා පටිපාටිය යටතේ පැවැත්වේ.

3. මේ පිළිබඳව උනන්දුවක් දක්වන යෝග්‍යතා පූර්ණ ලංසුකරුවන්හට වැඩිමනත් විස්තර 0112 – 101559 දරන දුරකතන අංකය අමතා ලබා ගත හැකි අතර3 වැනි ඡේදයේ සඳහන් ව ඇතිලිපිනයේ පිහිටි කාර්යාලයට පැමිණ හෝ දෙපාර්තමේන්තු වෙබ් අඩවිය වන www.immigration.gov.lk හරහා හෝ 2025.08.01 දින සිට 2025.08.21 දින දක්වා**සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00**දක්වා කාල පරිච්ඡේදය තුළ දීනොමිලේ ලංසු ලිපිලේඛන පරීක්ෂාව සිදු කළ හැක.

4. රුපියල් පන්දහසක (රු.5,000.00) ක ආපසු නොගෙවන ගාස්තුවක් ගෙවීමෙන් හා ලිඛිත අයදුම්පතක් බත්තරමුල්ල, ශ්‍රී සුභූතිපුර පාරේ, "සුහුරුපාය", ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ, 05 වන මහලේ,ප්‍රසම්පාදන අංශයේ නියෝජ්‍ය පාලක (ප්‍රසම්පාදන) වෙත ඉදිරිපත් කිරීමෙන් පසු මේ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ඉංග්‍රීසි **භාෂාවෙන් ඇති සම්පූර්ණ ලංසු ලිපිලේඛන කට්ටලයක්2025.08.01 දින සිට2025.08.21 දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා කාල පරිච්ඡේදය තුළදී** මිල දී ගත හැක. ගෙවීම් කළ යුත්තේ මුදලිනි.

5. නිසි ලෙස **සම්පූර්ණ** කරන ලද ලංසු,"මුල් පිටපත"(Original) හා "අනුපිටපත" (Duplicate) ලෙස පිටපත් දෙකකින් යුතුව වෙන වෙනමම කවරවල බහා එම කවරඑකම කවරයක බහා මුද්‍රා තබාමෙම මුද්‍රා තැබූ කවරයේ වම්පස ඉහළ කෙළවරේ කොන්ත්‍රාත්කරුගේ නම සහ IFB අංකය සඳහන් කර 7 වැනි ඡේදයේ සඳහන් කර ඇති ලිපිනයට 2025.08.22වැනි දින ප.ව.2.00ට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ අතින් ගෙනවිත් බාරදීම හෝ සිදු කළ යුතුය.ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු කැඳවීම අවසන් වූ වහාම,7 වැනි ඡේදයේ සඳහන් ලිපිනයේ දී 2025.08.22වැනි දින ප.ව. 2.00ට**පැමිණීම සඳහා කැමැත්ත දක්වන ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් ඉදිරියේදී ලංසු විවෘත** කරනු ලැබේ.

6. භාරදෙනු ලබන ලංසුව ලංසු භාරගන්නා අවසාන දින සිට දින අනූ එකක් (91) දක්වා හෝ ගැනුම්කරු විසින් නියම කරනු ලබන ඕනෑම දිගුකරන කාල පරිච්ඡේදයක් සඳහා වලංගුභාවයෙන් යුක්ත විය යුතුය.සියලුම ලංසුශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද, ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන වාණිජ බැංකුවකින් නිකුත් කරන ලද රුපියල් භාරලක්ෂයක් (රු. 400,000/-) වටිනා ලංසු සුරක්ෂණයක ආකාර බැංකු ඇපකරයක් සමඟ එවිය යුතුය.

7. **2025.08.11** වෙනි දින **පෙ.ව. 10.00**ට බත්තරමුල්ල, ශ්‍රී සුභූතිපුර පාරේ, "සුහුරුපාය", ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ,05 වන මහලේ**දීපූර්ව ලංසු රැස්වීමක් පැවැත්වෙනු** ඇත.

**සභාපති,**
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
05 වැනි මහල,
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව,
"සුහුරුපාය",
ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල.